ඔබ අතරින් කෙනෙකුගේ භාජනයේ සුනඛයා පානය කළ විට, එය සත් වතාවක් සෝදා හැරිය යුතුය

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "ඔබ අතරින්
කෙනෙකුගේ භාජනයේ සුනඛයා පානය කළ විට, එය සත් වතාවක් සෝදා හැරිය යුතුය." මුස්ලිම් සතු හදීසයක: "එහි ආරම්භය පසින් විය යුතුය" යැයි සඳහන් වී ඇත. [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

සුනඛයා උගේ දිව භාජනය තුළට දැමූ විටෙක එය සත් වතාවක් සෝදා හරින මෙන් නබි (සල්ලල්ලාහු අලයහි වසල්ලම්) තුමාණෝ නියෝග කළහ. ඒ අතරින් පළමු වාරයේ, ජලය යොදා ගැනීමට පෙර පස් එකතු කළ යුතු ය. එවිට එහි අපරිසිදු භාවයෙන් හා එහි හානියෙන් එය පරිපූර්ණ පිරිසිදුභාවය ලබනු ඇත.

https://www.sunnah.global/hadeeth/si/show/3143